# සංවර්ධනය සඳහා නොවූ ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යාපෘති: මොණරාගල දිස්ත්‍රික්කයේ තෝරාගත් ග්‍රාම නිලධාරී කොට්ඨාස තුනක් ඇසුරින්

එච්.ඒ.එස්.යූ. ගීතාංජලී - දේශපාලනවිද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය

මෙම පර්යේෂණය මොණරාගල ප්‍රදේශයේ දරිද්‍රතාව ඉලක්ක කර ගනිමින් පසුගිය දශක කිහිපයෙහි ක්‍රියාත්මක වූ වැඩසටහන්වලින් සැලකිය යුතු සංවර්ධනයක් සිදු නොවී ඇත්තේ මන්ද යන ගැටලුව අධ්‍යයනය කෙරෙයි. අධ්‍යයනයේ දී දැයට කිරුළ හා එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා යන සංවර්ධන ව්‍යාපෘති ද්විත්වය පාදක කොට ගැනුණි. ප්‍රධාන අධ්‍යයන ක්ෂේත්‍ර ලෙස මොණරාගල දිස්ත්‍රික්කයේ හුලංදාව, ඔක්කම්පිටිය හා උඩගම යන ග්‍රාම නිලධාරී කොට්ඨාස ත්‍රිත්වය උපයුක්ත කර ගැනුණි. ප්‍රත්‍යක්ෂමූලවාදී හා පශ්චාත් ප්‍රත්‍යක්ෂමූලවාදී ක්‍රමවේද යොදා ගැනුණි. දේශපාලනඥයන් (11), සාමාන්‍ය වැසියන් (40), රාජ්‍ය නිලධාරීන් (16) හා අතරමැදි පාර්ශ්ව (05) යන නියැදියට ඖචිත්‍ය වන අයුරින් සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලී, නිරීක්ෂණ යන විධික්‍රම භාවිත විය. අධ්‍යයනයට පාත්‍ර වූ ව්‍යාපෘති සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක වීමට මූලික ලෙස පදනම්ව ඇත්තේ, ප්‍රධාන දේශපාලන පක්ෂ අතර ඇති අනුග්‍රාහක සබඳතාවේ බල අරගලය යි. මෙවැනි ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී දේශපාලඥයන්, රාජ්‍ය නිලධරීන් හා ජනතාව අතර පක්ෂ හා විපක්ෂ ලෙස පාර්ශ්ව දෙකකට බෙදේ. එහි ප්‍රතිඵලයක් ලෙස අදාළ සමාජය තුළ යම් කණ්ඩාමයක් ප්‍රතිලාභීන් ලෙසත්, යම් කණ්ඩායමක් ආන්තීකරණයට ලක් වූවන් ලෙසත් හඳුනාගත හැකිය. මෙවැනි ව්‍යාපෘති මගින්, දේශපාලඥයා ඡන්ද මෙන්ම මුදල් ද රැස් කරගන්නේ දේශපාලන අතරමැදි පන්තියක් ද බිහි කරයි. එම නිසා ව්‍යාපෘතිවල ප්‍රතිලාභ සුළු ලෙස ප්‍රතිලාභීන් කෙරෙහි ඉලක්කගත වේ. එයට හේතුව වන්නේ, ව්‍යාපෘති ජනතාව කේන්ද්‍ර කර ගනිමින් ආරම්භ කළ ද ප්‍රධාන දේශපාලන නායකයන් හා අතරමැදි පාර්ශ්ව එහි ප්‍රතිලාභ භුක්ති විඳිමයි. එමෙන්ම මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය නිලධාරීහු අදාළ දේශපාලන ව්‍යාපෘතිවලට අනුගත වෙමින් ප්‍රතිලාභ ලබන අතර නැතහොත් දේශපාලන පක්ෂයේ උදහසින් වැළකීමට නිශ්ශබ්දව සිටිති. කෙතරම් අකර්මන්‍යතා පැවතිය ද, බහුතර ප්‍රජාව මෙවැනි ව්‍යාපෘති සඳහා විරුද්ධ වනවා වෙනුවට අතරමැදි පාර්ශ්ව සමග සම්බන්ධ වෙමින් හෝ තාවකාලික ප්‍රතිලාභ ලබා ගැනීමට උත්සුක වේ. එබැවින්, මෙකී ව්‍යාපෘති ද්විත්වයේම හඳුනාගත හැකි වූයේ මානව සම්පත් හා ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය කිරීමට වඩා, බලයේ සිටින පක්ෂයේ හා එහි සාමාජිකයන්ගේ දැත් ශක්තිමත් කිරීමයි. පර්යේෂණයේ දී අනාවරණය කරගත් මෙම කරුණු ඔස්සේ නිගමනය කළ හැකි වන්නේ, ඡන්ද පදනමේ සුරක්ෂිතතාව වෙනුවෙන් සංවර්ධන ව්‍යාපෘති දේශපාලනීකරණය වී ඇති අතර, ඡන්දදායකයා ද එයට අනුවර්තනය වීමේ ශක්‍යතාව මත පුද්ගලයාගේ සුභසාධනය හා සංවර්ධනය සිදුවන බවයි. එනම්, පොදු සුභසාධනය පසෙකලා පෞද්ගලික සුභසාධනයට සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රමුඛතාව හිමි වන බව ය.

**මූලික පද:** *මහජන සුභසාධනය, ප්‍රජා සංවර්ධනය, ප්‍රතිපත්ති, ප්‍රභූ අධිකාරිය*